**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ 2021/03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය | | |
| (i.) 7.4 ඡේදය පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ( ඒසීඒ-එෆ්) "භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණ" දැක්වන අගයෙහි වසර තුල හා වසර අවසානයේදී භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණ ඇතුලත් විය යුතුය. නමුත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල 2021 වර්ෂයේ භාණ්ඩාගරය වෙත ප්‍රේෂණ දක්වා තිබුණද, 2020 වර්ෂයට අදාළ නැවත ගලපන ප්‍රකාශයෙහි භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණ රු.4,169,656ක් ඇතුලත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් වල ශුද්ධ වෙනස් වීම් සටහන් කිරීමේදී ලිපිකරන දෝශයක් හේතුවෙන් 54,000 ක් වශයෙන් වූ නිවැරදි සටහන වෙනුවට අමතරව භාණ්ඩාගාරයට පියවන ලද 4,169,656ක මුදලක්ද සටහනව ඇත. | 2020 වර්ෂයට අදාළ නැවත ගලපන ප්‍රකාශයෙහි භාණ්ඩාගාරය වෙත කරන ලද ප්‍රේෂණ රු.4,169,656ක් ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii.) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.2 හා 7.5 ඡේද ප්‍රකාරව සිදු කරන ලද වෙනස්කම්වලට අදාළව පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම සිදුකර තිබුණද ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාගෝපදේශ 2021/03 හා 2021.11.26 දිනැති මාර්ගෝපදේශයෙහි 7.2 හා 7.5 යටතේ දැක්වෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වූ මගපෙන්වීම අනුව 2021 වර්ෂය වෙනුවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ- එෆ් හෙවත් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය සකස් කොට විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමි. | පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම හෙළිදරව් කළ යුතුය. |
| (iii.) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේද ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදු කරන ලද වෙනස්කම් වලට අනුව කාලපරිච්ඡේදය තුල භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද මුදල්, කාලපරිච්ඡේදය අවසානයේ මුදල් ශේෂයට ඇතුළත් නොවන ආකාරයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර තිබුණද, ඉකුත් වර්ෂයේ නැවත ගලපන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම රු.4,169,656ක වටිනාකමක් අවසාන මුදල් ශේෂයේ ඇතුලත් කර තිබුණි. | 2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් වල ශුද්ධ වෙනස් වීම් සටහන් කිරීමේදී ලිපිකරන දෝශයක් හේතුවෙන් 54,000 ක් වශයෙන් වූ නිවැරදි සටහන වෙනුවට අමතරව භාණ්ඩාගාරයට පියවන 4,169,656ක මුදලක්ද සටහන්ව ඇත. | ඉකුත් වර්ෂයේ නැවත ගලපන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම රු.4,169,656ක වටිනාකමක් අවසාන මුදල් ශේෂයට ඇතුළත් නොවන ආකාරයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතුය. |

## 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

---------------------

### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i.) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත වාර්තාව (එස්ඒ82) අනුව ආරම්භක ශේෂය වන රු.9,232,484,175ට රු.320,088,484ක් ගැලපීමෙන් නව ආරම්භක ශේෂය ලෙස රු.9,552,572,659ක් ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 වර්ෂයේ අවසානයේ දේපල පිරියත හා උපකරණවල ශේෂය රු.9,033,979,239ක් විය. මේ අනුව පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා මේ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, මූල්‍ය නොවන වත්කම් හී ආරම්භක ශේෂයේ රු.518,593,420ක වෙනසක් නිරීක්ෂණය විය. නමුත් මෙම වෙනස්කම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීමක් වශයෙන් සිදු කළ යුතු වුවද, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂයේ අගයන් සංසන්දනාත්මකව ගැලපීම් සඳහා නියමිත ආකෘති පත්‍රයක් නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩාගාර SA-82 මුද්‍රිත වාර්තාව මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට කටයුතු කළ බව විගණනය වෙත දන්වා සිටිමි. | මෙම වෙනස්කම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීමක් වශයෙන් සිදු කළ යුතුය. |
| (ii.) භාණ්ඩාගර එස්ඒ82 ආකෘතියට අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණවල වර්ෂය අවසානයේදී වටිනාකම රු.420,955,588ක් වුවද, දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහනට අනුව එම වටිනාකම රු.420,321,788ක් විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම භාණ්ඩාගාර එස්ඒ82 ආකෘතියට හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහනට අනුව රු.633,800ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනසට හේතුව වන්නේ දෙපාර්තමේන්තු පොත් වලින් ඉවත් කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු සිගාස් වෙබ් අතුරු මුහුණත මගින් භාණ්ඩාගාරය වෙත වාර්තා කලද එම අගයන් භාණ්ඩාගාර **SA**-82 ආකෘතිය තුල ගැලපීම් සිදු නොවීමයි. මේ පිළිබඳව භාණ්ඩාගාරය වෙත දැනුම් දී අදාළ නිවැරදි කර ගැනීම සිදු කිරීමට කටයුතු කර ඇති බව විගණනය වෙත දන්වා සිටිමි. | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම භාණ්ඩාගාර එස්ඒ82 ආකෘතියට හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහනට සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii.) | අක්කර 346 පර්චස් 89.6 ඉඩම්වල හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පැවතියද වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම් ගත කර නොතිබුණි. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු අක්කර 346 පර්චස් 89.6 ක ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අදාළ පිඹුරුපත් යොමුකර තිබුණද මේ වන තෙක් ඊට අදාළ තක්සේරු වාර්තා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බැවින් ගිණුම් ගත කර නොමැති බව විගණනය වෙත දන්වා සිටිමි. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හිමිකම තිබෙන ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (iv.) | දෙපාර්තමේන්තුවේ නමට හිමිකම පවරාගෙන නොමැතිව රු.347,875,000ක වටිනාකමින් යුතු ඉඩම් ගිණුම්ගත කර තිබුණි. එම වටිනාකම් ගිණුම්කර ඇති බව දෙපාර්තමේන්තුව හඳුනාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ නමට හිමිකම් පවරාගෙන නොමැති රු.347,875,000ක වටිනාකමින් යුත් ඉඩම් ගිණුම් ගත කර ඇති බව විගණන වාර්තාවේ දක්වා තිබුණද එවැනි වටිනාකමක් දෙපාර්තමේන්තු පොත්වල ගිණුම්ගත වී නොමැති බව විගණනයට දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුව නමට හිමිකම පවරාගෙන නොමැති ඉඩම් ගිණුම්ගත කිරීමට පෙර හිමිකම පවරාගත යුතුය. |
| (v.) | අක්කර 392 පර්චස් 132.8ක ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරාගැනීම, වටිනාකම තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීම සිදුකර නොතිබුණද, මෙම ඉඩම් බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිර කඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපලවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි. | අක්කර 392 පර්චස් 132.8ක ඉඩම් ප්‍රමාණයක හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්, අදාල පවරා ගැනීමෙන් පසු තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බවත් දන්වන අතර අවශ්‍යතාවය මත මෙම ඉඩම් බන්ධනාගාර සිර මැදිරි, එළිමහන් සිර කඳවුරු, පුනුරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපලවල් වශයෙන් භාවිතයට ගනු ලබන බව විගණනයට දන්වා සිටිමි. | මෙම ඉඩම්වල හිමිකම පවරාගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ආකෘතිය ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබීම. | මු.රෙ 110 ආකෘතිය ප්‍රකාරව හානි ලේඛණයක් පවත්වාගෙන යනු ලබන අතර එම ලේඛණයේ යාවත්කාලීනයන් නිසි පරිදි සිදුකර නොමැති බැවින් කඩිනමින් අදාල ලේඛණය යාවත්කාලීන කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නිසිපරිදි පවත්වාගෙන යා යුතුය. |

**(ඇ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුම් 05ක වර්ෂ 02ක් ඉක්ම වූ රු.84,696,013ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ 571අනුව කටයුතු කිරීම සඳහා සියළුම ආයතන වල බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.3. විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති ණයගැති රු.49,563,423 ක ශේෂයෙන් රු.26,376,961ක ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි. | ඉදිරිපත් නොකල සාක්ෂි යටතේ විගණන විමසුම තුල ණයගැති ශේෂ වටිනාකම ලෙස රු.26,376,961.00ක් ලෙස සටහන් වේ. නමුත් 2021 වර්ෂයට අදාළ අවසාන ගිණුමේ ණය ගැති ශේෂය (2021.12.30 දක්වා) රු.49,563,423.00 වන අතර 2021 වර්ෂයට අදාළ ණය ගැති ශේෂය 19,725,349.81ක් ලෙස වාර්ථා කර ඇත. | ණයගැති සම්පූර්ණ ශේෂයම තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ පවත්වා ගෙන යනු ලබන ආපනශාලා වලින් ලැබිය යුතු කුලී ආදායම් හඳුනාගෙන එම ආදායම් මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශිර්ෂ අංක 05 හී ආදායම් සංකේත අංක 20-02-01-01 යටතේ බදු කුලී ආදායම් ලෙස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගේ හා රැඳවියන්ගෙ පුහුණු හා ක්‍රිඩා කෞෂල්‍යා ඉහළ නංවාලීමට රජයේ අයවැයෙන් ප්‍රමාණවත් මුදලක් වෙන් නොකරන බැවින් එය අදායම් සංගම්වල ගිණුම් වලට ඉතා දිගු කාලයක සිට බැර කර ඇත. | මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) සිර හා සැකකරුවන් වෙත භාණ්ඩ හා ආහාර අළෙවිය මහින් මෙම ආපනශාලා විශාල ආදායමක් උපයා ගනු ලබයි. නියැදි පදනමක් මත කළ පරීක්ෂාවේ දී බෝගම්බර බන්ධනාගාර ආපනශාලාව 2021 | බන්ධනාගාර ආයතන වල ආරක්ෂාව හේතුවෙන් බාහිර පාර්ශවයන්ගෙන් සේවය ලබා ගත නොහැක. බන්ධනාගාර නිලධාරීන්ට මෙහි සේවයේ යෙදවීමට සිදුවේ. | මෙම වියදම් ආපනශාලාවලින් ලබන ශුද්ධ ආදායමෙන් අඩු කර රජයට ප්‍රතිපූර්ණය කළ යුතුය. |

වර්ෂයේ දී මාස 08 ක් තුළ සිර හා සැකකරුවන් වෙත භාණ්ඩ අළෙවියෙන් පමණක් රුපියල් මිලියන 10 කට වඩා වැඩි මුදලක් උපයාගෙන තිබුණි. නමුත් මෙම කාලපරිච්ඡේදය තුළ ආපනශාලා වෙත අනුයුක්ත කර තිබූ නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.1,423,853 ක ප්‍රමාණයක් ද ජලය,විදුලිය වෙනුවෙන් වියදම් ද දරා තිබුණ ද මෙම කිසිදු වියදමක් අපනශාලාව ලබන ආදායමෙන් අඩුකර රජයට ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව මෙම අපනශාලාවට අවශ්‍ය ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා බන්ධනාගාර රැඳවියන් දෙදෙනෙකුගේ සේවයද ලබා දී තිබුණි. 2021 අගෝස්තු සිට දෙසැම්බර් මස දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආපනශාලා වෙත නිලධාරී 63දෙනෙකු යොදවා තිබූ අතර එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.16,495,141ක මුදලක් ඒකාබද්ධ අරමුදලින් වැය කර තිබුණි. මීට අමතරව ආපනශාලාවල සේවය සඳහා රැඳවියන් 103 දෙනෙකු අනුයුක්ත කර තිබුණි.

## 2.2. වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයන් 10ක් සඳහා සලසා ගෙන තිබූ රු.417,200,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින් සියයට 30කට වැඩියෙන් එනම් රු.126,447,218ක ප්‍රතිපාදන ඉතිරිව තිබූ අතර එම එක් එක් වැය විෂයන් හී ඉතිරිවීම් සියයට 21 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | පහත සඳහන් හේතු මත ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි.<br>• අක්මුදල් නොලැබීම<br>• අමතර කොටස්වල මිල ඉහල යාම,අමතර කොටස්වල හිඟතාවය මත අපේක්ෂිත අළුත්වැඩියාවන් සිදු කොට අවසන් කිරීමට නොහැකි වීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

- සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා බැඳීම් ඇති කොට ගෙන බැරකමට ලක්ව ඇත.
- වර්ෂය අවසන් වීමට මත්තෙන් පියවීම සඳහා බිල්පත් ඉදිරිපත් නොවීම

- බන්ධනාගාර විතැන් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරි මගින් සිදු කිරීම හේතුවෙන් ඒ වෙනුවෙන් වන වියදම් සිදු නොවීම.

- ලැබීතිබු ප්‍රාග්ධන අක්මුදල් අදාළ බිල්පත් ගෙවීමට ප්‍රමාණවත් නොවීම.

- වර්ෂ අවසන් වීමට පෙර ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම.

- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි අදාළ පාඨමාලා නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම.

- වෙළඳපොල මිල ගණන් අධික ලෙස උච්ඡාවචනයන්ට ලක් වීම හේතු වේ.

| | | |
|---|---|---|
| (ආ) 2020 අංක 07 දරන විසර්ජන පනත ප්‍රකාරව, 232-01-01-0-2104 යන වැය විෂය යටතේ සලසා තිබූ මුල් ප්‍රතිපාදනය රු.මිලියන 22ක් වන අතර පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් තවදුරටත් රු.මිලියන 145ක් ලබා දී තිබුණි. මෙම වැය විෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 37.552ක් මු.රෙ.66 යටතේ මාරු කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අරමුණුගත කාර්යය සඳහා වැය කර නොතිබුණි. | විවිධ හේතු තත්ත්වයන් මත වර්ෂ අවසානය වන විට ලබා දී තිබූ ප්‍රතිපාදන අපේක්ෂිත අයුරින් උපයෝජනය කිරීමට නොහැකි වන බවට වූ නිරීක්ෂණ හේතුවෙන් වර්ෂය තුළ අවශ්‍ය වියදම් සඳහා ප්‍රතිපාදන ඌනතා සහිත වැය විෂයන් වෙත රු.මිලියන 37.55ක් මු. රෙ 66 යටතේ මාරු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ප්‍රතිපාදන අරමුණු ගත කාර්යයන් සඳහා නොයෙදීම සම්බන්දයෙන් දක්වන ලද විගණන නිරීක්ෂණය සමඟ එකඟවිය හැකි වුවත් අවස්ථානුකූලව ක්‍රියාමාර්ග ගෙන ඇති බව පෙන්වා දෙමි. | පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අරමුණුගත කාර්යය සඳහා වැය කළ යුතු වේ. |
| (ඇ) 232-01-01-05-2104 වැය විෂය යටතේ අයවැය ගත මුල් ප්‍රතිපාදනයට අමතරව රු.මිලියන 30.2ක් මු.රෙ.66 ප්‍රතිපාදන යටතේ මාරු කර තිබුණද, මු.රෙ.66 යටතේ මාරු කල ප්‍රතිපාදන සියයට 100ක්ම වියදම් කර නොතිබුණි. | වර්ෂ අවසානයේදී භාණ්ඩාගාරය මගින් අපේක්ෂිත අක්මුදල් සපයා ගැනීමට නොහැකි වීමෙන් අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.3 සීමා ඉක්මවීම්.**

---------------

රජයේ අත්තිකාරම් කාර්යයන් සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ඉක්මවීම් හා ළඟා නොවීම් පිළිබඳ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අංක 07 දරන විසර්ජන පනත අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ (232011) අවම ලැබීම් සීමාව රු.135,000,000ක් වුවද සත්‍ය ලැබීම් රු.118,352,926ක් වුයෙන් අවම ලැබීම් සීමාවට ලගා වී නොතිබුණි. 2021 දෙසැම්බර් 31 වන දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකරණ අමාත්‍යාංශ ලේකම් ඇමතු අංක | අංක බ/13/අමා.මණ්.සංදේශ/2016 හා 2021.10.12 දිනැති ලිපිය මගින් සීමා සංශෝධනය සඳහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද අතර එම ඉල්ලීමට පිළිතුරු වශයෙන් අත්තිකාරම් බී ගිණුමේ අවම ලැබීම් සීමාව සංශෝධනය සඳහා ජාතික | අත්තිකාරම් ගිණුමේ අනුමත සීමාවන් සංශෝධනය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| BD/AA/LR/01/2022 දරන ලිපිය මගින් දන්වා තිබුනේ මෙම අත්තිකාරම් ගිණුමේ අනුමත සීමාවන් සංශෝධනය කිරීම සඳහා මුදල් අමාත්‍යතුමා වෙත නිර්දේශ කිරීමට කටයුතු කරන බවයි. | අයවැය දෙපාර්තමේන්තුව මගින් අංක BD/AA/LR/01/2022 හා 2021.12.31 දිනැති ලිපියෙන් ආවරණය අනුමැතියක් ලබා දී ඇත. ඒ අනුව එහි සඳහන් සීමාව වන රු.105,000,000 ලෙස මූල්‍ය ප්‍රකාශණයේ ඒමීඒ-5 ආකෘතිය මගින් දක්වා ඇත. | |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කිරීම පිණිස සෑම කාර්තුවකටම වරක් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වාර පවත්වමින් විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා කටයුතු කොට ඇති අතර ඉදිරියේදී එම කටයුතු වලට අදාළ සමාලෝචන වාර්තා පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **නිරීක්ෂණය**<br>**වටිනාකම (රු)** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) මෝටර් වාහන පනතෙ 25(1) | - | වලංගු ආදායම් බලපත්‍රයක් නොමැතිව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාහන 91ක් ධාවනයේ යොදවා තිබීම. | අදාළ වාහන බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමට පවරා ගැනීමෙන් අනතුරුව නිසි පරිදි ආදායම් බලපත්‍ර ලබා ගෙන ධාවනයේ යෙදවීමට කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරීවරුන් වෙත දන්වා ඇත. | වලංගු ආදායම් බලපත්‍රයක් ලබා ගෙන වාහන ධාවනයේ යෙදවිය යුතුය. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | | |
| (i.) මුදල් රෙගුලාසි 502(ආ) | 26,376,961 | දීර්ඝ කාලයක සිට පැවත එන පහත සඳහන් ලැබිය යුතු ණය ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| | | • බන්ධනාගාරය විසින් රාජ්‍ය අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු | • මෙම හිඟ බිල්පත් වලින් වැඩි ප්‍රමාණයක් 2015ට පෙර ඒවා වේ. පැරණි බිල්පත් අස්ථාන ගතවීම නිසා | මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රු.50,009,035 ක ශේෂයෙන් වසර 20කට වඩා පැරණි රු.1,640,307 හා වසර 5 – 20 ත් අතර රු.24,701,036 ක ලැබිය යුතු ශේෂ. | නිවැරදි සංඛ්‍යා ලේඛණ ලබා ගැනීමට අපහසු වී ඇත. 2018 වර්ෂයේ රු.66,500.00ක හිඟ බිල්පත් ගෙවීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර 2019 සහ 2020 වර්ෂවල හිඟ බිල්පත් නිරවුල් කිරීම කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ආයතනවලට ලබා දී ඇත. | |
| | | | • පෞද්ගලික අංශය වෙත සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු.35,618ක ශේෂයෙන් වසර 20කට වඩා පැරණි රු.19,034ක් හා වසර 10-20ත් අතර රු.16,584ක ලැබිය යුතු ශේෂ. | • පෞද්ගලික අංශයෙන් ලැබිය යුතුව පවතින රු.35,618.00ක මුදල සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත. | මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ii.) | මුදල් රෙගුලාසි 751(5) | - | දිරාපත්වීමෙන් හා අපතේයෑමෙන් හානි සිදුවීම වැළැක්වීමට පියවර ගනිමින් භාණ්ඩවල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු වුවත්, එසේ නොකිරීම නිසා වැලිකඩ බන්ධනාගාරයේ තීන්ත ලිටර් 108ක් | දිරාපත්වීමෙන් හා අපතේයෑමෙන් හානි සිදුවීම වැළැක්වීමට පියවර ගන්නා ලෙසත් භාණ්ඩවල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන යෙදීමටත් ගබඩා භාරකරුට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 751(5) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | හා පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුරේ ඖෂධ ගබඩාවේ විෂයයන් 03කට අදාළ ඒකක 2005ක තොග කල් ඉකුත් වී තිබුණි. | | |
| (iii.) මුදල් රෙගුලාසි 770(4) | - | වසර 1-10ත් අතර කාලයක සිට භාවිතයෙන් ඉවත් කළ වාහන 72ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදු කර නොතිබීම. | මේ වන විට කොළඹ බන්ධනාගාරයට අදාළ වාහන 14ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදු කරන අතර, එයින් වාහන 05 ක් වෘත්තීය පුහුණු අධිකාරියට හා පාසල්වලටද ලබා දී ඇති අතර ඉතිරි සියලු වාහන සඳහා අපහරණ කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව, ලබාගත් අත්තිකාරම් මුදලක් කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන් සඳහා අවස්ථා 25කදී ලබා දී තිබූ රු.240,795ක අත්තිකාරම් මුදල්, මුදල් පිය විය යුතු දිනයේ සිට සති 02ත් මාස 07ත් අතර කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් හා රාජකාරී කටයුතු සිදු වූ සුළු ප්‍රමාදයන් හේතුවෙන් අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයක් සිදු වී ඇති අතර අදාළ කාර්යය නිම වූ වහාම අතුරු අග්‍රිම පියවීමට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.7 බැංකු ගිණුම් මෙහෙයවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 12ක නිකුත් කළ දින සිට මාස 06 ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොකරන ලද එකතුව රු.165,559ක් වූ චෙක්පත් 37ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කරන මෙන් උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වර්ෂය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාළව සත්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඒ අනුව සැලසුම් සකස් නොකර නාමමාත්‍රික (Dummy) ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන තක්සේරු කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි. පසුව වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම්වලට සරිලන ආකාරයට වර්ෂය අවසානයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර තිබුණි. මේ ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම නිසා<br><br>➢ අස්ථිත්වය විසින් සිදු කරනු ලබන සියලුම කාර්යයන් (භාණ්ඩ,සේවා හා ව්‍යාපෘති) පූර්ණය කිරීමට යොදා ගන්නා කළමණාකරන මෙවලමක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කර ගැනීමට නොහැකි වීම. | බන්ධනාගාර දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මේ නිශ්චිත කාර්යය හඳුනා නොගෙන නාමමාත්‍රික ලෙස ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ වැය විෂය 2001,2002,2003ටය එයට අදාළ කාර්යයන් හඳුනා ගෙන ඊට අදාළ වැය ඇස්තමේන්තු මත පදනම්ව නොව ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් පමණක් ඒ සඳහා අදාළ කර ගනු ලබන්නේ බලධාරීත්වය විසින් පසුගිය වසර වල පලපුරුද්ද මත පදනම්ව ආයතන වෙත වැය වෙතැයි අපේක්ෂිත මුදලකට ප්‍රතිපාදන වෙන් කරන බැවිනි. | සකසුරුවමින්, කාර්යක්ෂමව හා ඵලදායී පරිදි කාලානුරූප ආකාරයට සැලැසුම් සම්පාදනය කර අපේක්ෂිත අරමුණු කරා ලඟා වීමට හැකි පරිදි කළමණාකරන මෙවලමක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතුය. |

- සකසුරුවමින්, කාර්යක්ෂමව හා ඵලදායී පරිදි කාලානුරූප ආකාරයට සැලැසුම් සම්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණු කරා ලගා වීමට නොහැකි වීම.

**3.2. කාර්යභාරයන් ඉටු නොකිරීම.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බන්ධනාගාර නේවාසිකයින් විධිමත්ව පුනරුත්ථාපනය මඟින් නීතිගරුක මානව හිතවාදී පුද්ගලයින් බවට පත් කර ශිෂ්ඨසම්පන්න සමාජයක් බිහි කිරීමට දායක වීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වන අතර, ඒ අනුව කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සිරකරුවන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ. නමුත් ඊට අනුගත නොවී පුද්ගලික ආයතනයක් විසින් සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට ගෙන එන ලද යෝජනාව පිළිගැනීමට හා අනුකූලතාවය දැක්වීමට එකඟ වී ඒ පිළිබඳව කැබිනට් සංදේශයක් සකස් කර කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i.) 2020 ජුනි 15 දින සිට 2022 මැයි 09 දින දක්වා කාලපරිච්ඡේදය තුළ මෙම පුහුණු ව්‍යාපෘතිය යටතේ අදාළ පුද්ගලික සමාගම විසින් සිරකරුවන් මිනිස් දින 50,103 ක කාලයක් විවිධ වැඩබිම්වල සේවයේ යොදවා තිබුණි. මේ සඳහා පුද්ගලික ආයතනයෙන් සිරකරුවෙකුට වේතන වශයෙන් දිනකට රු.400 ක් ගෙවනු ලබන අතර මීට අමතරව සිරකරු සුභසාධක අරමුදලට සහ රජයේ ආදායමට රු.50 බැගින් බැර කරනු ලබයි. නමුත් එක් සිරකරුවෙකුගෙන් දිනකට (මිනිස් දිනකට) අවම වශයෙන් | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,000 ක ලාභයක් ඉපයීමට හැකි වුවහොත් ඒ අනුව ඉහත කාලපරිච්ඡේදය තුළ අදාළ පුද්ගලික ආයතනයට රුපියල් මිලියන 50 කට අධික ලාභයක් උපයාගැනීමට අවස්ථාව සැලසී තිබුණි. | | |
| (ii.) | සෑම සිරකරුවෙක් සඳහාම තෝරාගත් අදාළ ක්ෂේත්‍රයක පූර්ණ දක්ෂතා සහිත තැනැත්තෙකු කිරීමේ අභිලාෂය ඇතිව වැඩබිම්වල සේවයේ යෙදීමට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස තුනක මූලික පුහුණුවක් ලබා දිය යුතු වුවත් වැඩබිම් වෙත රැගෙන ගිය සිරකරුවන් 104 ක් සඳහා මූලික පුහුණුව ලබා දී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |
| (iii.) | යෝජිත ව්‍යාපෘතිය යටතේ පුහුණුව අවසන් කරනු ලැබූ බන්ධනාගාර සිරකරුවන්හට ජාතික වෘත්තීය මට්ටමේ පුහුණු සහතිකයක් (NVQ) ලබා දීමට කටයුතු කළ යුතු වුවත් පුහුණුව නිමකළ සිරකරුවන් 236 ක් සඳහා මෙතෙක් එවැනි නිපුණතා සහතික ලබා දී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |
| (iv.) | මෙම වැඩසටහනට අනුව විදේශ රැකියා ලබා දීමේ අපේක්ෂාව ඇතිව සිරකරුවන්හට ඉංග්‍රිසි, ප්‍රංශ, ජර්මන් සහ අරාබි වැනි විදේශීය භාෂා ප්‍රවීණතාවයක් ලබා දිය යුතු වුවත් එය ප්‍රමාණවත් පරිදි සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |
| (v.) | ඉහත ව්‍යාපෘතියට සිරකරු පුහුණු ශ්‍රමය යෙදවීම තුළ බන්ධනාගාර තුළ කර්මාන්ත අංශයට අවශ්‍ය ප්‍රමාණවත් සිරකරු පුහුණු හා නොපුහුණු ශ්‍රමය නොමැති වීම නිසා කර්මාන්ත අංශවල කාර්යසාධනය ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi.) | බන්ධනාගාර තුළ කර්මාන්ත අංශයේ ව්‍යාපෘති තුළ සිරකරුවන්ට වෘත්තීය පුහුණු ලබා දීම තුළින් විධිමත්ව පුනරුත්ථාපනය කිරීමට හැකියාව තිබියදී ඉහත ව්‍යාපෘතියට සිරකරුවන් යොදා ගැනීම තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවී තිබුණි. | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |
| (vii.) | 2022 මැයි 09 වන දින ඇති වූ තත්ත්වයෙන් පසු විගණන දිනය දක්වා මෙම ව්‍යාපෘතිය සඳහා සිරකරුවන් වැඩබිම්වලට රැගෙන ගොස් නොතිබුණු අතර එම කාලපරිච්ඡේදය තුළ සිරකරුවන් වටරැක වැඩ කඳවුරේ කෘෂිකාර්මික වැඩබිම් කාර්යයන්වල නිරතවී සැලකිය යුතු කාර්යය කොටසක් ඉටු කර ඇති බව 2022 මැයි 27 දින විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන්ට අනුගතවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | රට තුළ කවර හෝ අධිකරණයක අධිකාරී බලය යටතේ බන්ධනාගාරගත කරන ලද සෑම තරාතිරකම සිරකරුවන් පිළිගැනීම සහ බන්ධනාගාර නීති, රීති වලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය හා නඩත්තුව සැලසීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකකි. නමුත් ඊට අනුගත නොවී කටයුතු කරන අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | | |
| (i.) | වාට්ටුවල හා සිරමැදිරිවල ප්‍රමාණවත් ඉඩපහසුකම් නොතිබීම | | |
| | පිලිගත් ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුකූලව (එක්සත් ජාතීන්ගේ ප්‍රමිත ගත කරුණු අනුව) හා බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදුකළ සංශෝධනයන් හී 178 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව එක් එක් සිර මැදිරි හි වාට්ටුවල රැඳවිය යුතු සිරකරුවන් ප්‍රමාණය ඔවුන්ගේ මානසික හා ශාරීරික | බන්ධනාගාර ගතවන රැඳවියන්ගේ ප්‍රමාණය දෛනිකව වැඩි වීම හේතුවෙන් වාට්ටු හා සිරමැදිරිවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මීට බලපා ඇත. එහෙයින් ගොඩනැගිලි ප්‍රමාණය උපරිම ප්‍රයෝජනයට ගෙන පුනරුත්තාපන ක්‍රියාවලිය සඳහා යොමු කරන | පිලිගත් ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදුකළ සංශෝධනයන් හී 178 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | යෝග්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට ඉඩ පහසුකම් සහිතව රඳවා තැබිය යුතු වුවත් ඊට අනුකූල නොවන ආකාරයෙන් බෝගම්බර (දුම්බර), මහර බන්ධනාගාරවල හා පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුරේ රැඳවියන් 1667ක් වැඩියෙන් රඳවා තිබුණි | සිරකරුවන් රඳවා තබා ගැනීමට කටයුතු කරයි. | |
| (ii.) | සිරකරුවන් වර්ගීකරණයකින් තොරව රැඳවීම | | |
| | සිරකරුවන් සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රමිතීන්ට අනුව අපරාධයේ/වරදේ ස්වභාවය, නීතිමය අවශ්‍යතාවය හා ප්‍රතිකර්ම අවශ්‍යතා අනුව සිරකරුවන් හා සැකකරුවන් වර්ගීකරණය කර වෙන වෙනම රැඳවීම අවශ්‍යතා මූලධර්මයක් වන අතර බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සංශෝධනයන්ට අනුව 178 ඡේදය ප්‍රකාරව බන්ධනාගාරයේ පවතින ඉඩ පහසුකම් අනුව එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම රඳවා ගත යුතුය. නමුත් ඊට අනුගත නොවී බෝගම්බර (දුම්බර), මහර බන්ධනාගාර වල රැඳවියන් 3253ක් රඳවා තිබුණි. | බන්ධනාගාර ගතවන්නන් රැඳවීමට හැකියාව ඇත්තේ ඉතාමත් සීමිත ඉඩ ප්‍රමාණයක වීම බන්ධනාගාර ගතවන්නන් වර්ගීකරණය කොට රැඳවීමට ඇති ප්‍රධානතම ගැටලුව වී ඇත. | පිළිගත් ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුකූව හා බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදුකළ සංශෝධනයන් හී 178 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය |
| (iii.) | සිරමැදිරි අබලන් තත්වයේ පැවතීම | | |
| | මහර බන්ධනාගාරය වසර ගණනාවකට පෙර ඉදිකරන ලද සිරමැදිරි සහ සිර වාට්ටු කාලීනව අලුත්වැඩියාවන් සිදු නොකිරීම නිසා අබලන් තත්ත්වයේ පැවතුණි. ගරා වැටෙමින් පවතින සිර වාට්ටු පැවතීම, සිර වාට්ටුවල වැසිකිළි පද්ධතිය අබලන්ව පැවතීම, සිර මැදිරි හා වාට්ටු තුළ පවතින අපිරිසිදු පරිසරය හා මදුරුවන්, මකුණන්,මීයන් වැනි සතුන් බෝවී පැවතීම නිසා රැදවියන්ට ප්‍රමාණවත් සනීපාරක්ෂක පරිසරයක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. මීට අමතරව පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුරේ සිර වාට්ටු නඩත්තු නොකර අබලන් | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් අවධානය යොමු කර අබලන් තත්ත්වයේ පවතින සිර මැදිරි අළුත්වැඩියා කර ගැනීම සඳහාත් සිර මැදිරි අවට පරිසරය වඩාත් පිරිසිදුව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරීවරුන් වෙත උපදෙස් දී ඇත. | බන්ධනාගාරගත කරන ලද සෑම තරාතිරකම සිරකරුවන්හට බන්ධනාගාර නීතිරීතිවලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය හා නඩත්තුව සැලසීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වයේ පැවතුන අතර වාට්ටුවල වැසිකිළි පහසුකම්ද ප්‍රමාණවත් පරිදි නොතිබුණි. | | |
| (iv.) | සිරගතවූවන් නැවත නැවත බන්ධනාගාරගත වීම | | |
| | කාලීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත් වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකකි. නමුත් නැවත නැවත සිරගතවන පුද්ගලයන් හඳුනා ගැනීමට බන්ධනාගාර තුල නිසි ක්‍රමවේදයක් නොතිබෙන අතර සිර කරුවන්ගෙන් වාචිකව ලබා ගන්නා තොරතුරු මත පදනම්ව බන්ධනාගාර විසින් අවිධිමත් ආකාරයෙන් මෙම තොරතුරු රැස් කරයි. බෝගම්බර, මහර බන්ධනාගාර වල හා පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුර තුළ පෙර සිර දඬුවම් නියම වී නිදහස් වී නැවත සිර දඬුවම් විඳින සිරකරුවන් සංඛ්‍යාව 220 ක් විය. | නැවත නැවත බන්ධනාගාර ගත වන පුද්ගලයින් හඳුනා ගැනීම අතිශය අභියෝගාත්මක තත්ත්වයක් බවට පත්ව ඇත. මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර යම් පුද්ගලයෙකු විවිධ නම් භාවිතා කර සිරගත වන අවස්ථාවන් නිරන්තරයෙන් වාර්තා වේ. බන්ධනාගාර තොරතුරු පද්ධතිය යටතේ බන්ධනාගාර ගතවන රැඳවියන්ගේ ජීවමිතික දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද අතර එම පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් වූ මූලික කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී. | රැඳවි පරිපාලන කටයුතු වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ඉටුකිරීම උදෙසා රැඳවියන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය |
| (v.) | රසපරීක්ෂණ වාර්තා නොලැබීම හේතුවෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීම | | |
| | මත්ද්‍රව්‍ය චෝදනා මත 54 වන වගන්තිය යටතේ අධිකරණය මඟින් බන්ධනාගාර ගත කර ඇති සිරකරුවන්ට අදාළ රසපරීක්ෂණ වාර්තා ලබා දීමට ප්‍රමාද වීම නිසා මහර, බෝගම්බර(දුම්බර) බන්ධනාගාර වල මාස 06ත් වසර 02ත් අතර කාලපරිච්ඡේදයක් තුළ සැකකරුවන් වශයෙන් 520ක් රඳවා තිබුණි. මෙම රැඳවියන් සඳහා විශාල නඩත්තු පිරිවැයක් බන්ධනාගාරය විසින් දැරුවද, ඔවුන් සැකකරුවන් හෙයින් ඔවුන්ගේ ශ්‍රම දායකත්වයද බන්ධනාගාරයට ලබා ගැනීමට නොහැකි වී ඇත. නමුත් අදාළ රස | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් මෙම සැක කරුවන්ගේ රස පරීක්ෂක වාර්තා ලබා දීම ප්‍රමාද වීම මත ඔවුන් දීර්ඝ කාලයක් බන්ධනාගාර ගතව සිටීමේ තත්ත්වය බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පාලනය කල හැකි තත්ත්වයක් නොවන බව පෙන්වා දෙයි. | කාලීන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රැඳවියන් යහපත් පුරවැසින් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසෙන පරිදි කටයුතු කළ යුතුය. |

පරීක්ෂණ වාර්තා ප්‍රමාදයකින් තොරව ලබා ගැනීම තුළින් වැරදිකරුවන්ට දඬුවම් නියම කිරීම හා වැරදිකරුවන් නොවන සැකකරුවන් නිදහස් කිරීම තුලින් මෙම අනවශ්‍ය නඩත්තු පිරිවැය අවම කරගත හැකිව පැවතුණි. මෙම ගැටලුකාරී තත්ත්වය හඳුනාගෙන එය වලක්වාලීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවට තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

## 3.3. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බන්ධනාගාර මූලස්ථාන ආපනශාලාව අසල වැසිකිළි අළුත්වැඩියාව සඳහා රු.208,716ක් වටිනා විෂයයන් 32කට අදාළ අයිතම 2020 නොවැම්බර් 27 දින මිලදී ගෙන තිබුණද, අදාළ අලුත්වැඩියාවන් මේ වන තෙක් සිදු කර නොතිබුණි. | මෙම අළුත්වැඩියාවට අදාළ භාණ්ඩ වලින් කොටසක් පමණක් මිලදී ගෙන තිබූ අතර කොවිඩ් වසංගත තත්ත්වය මත වෙළඳසල් වසා තිබූ බැවින් ඉතිරි භාණ්ඩ නොමැතිව අළුත්වැඩියාව ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව පෙන්වා දෙමි. | අදාළ අළුත්වැඩියාව තවදුරටත් ප්‍රමාද නොකර සිදුකළ යුතුය. |

## 3.4. වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හී සඳහන් ආකෘතිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයට අදාළව කාර්යසාධන වාර්තාව පිළියෙල කර තිබුණි. එම වර්තාවේ **7** පරිච්ඡේදය යටතේ අනුකූලතා වාර්තාව ඉදිරිපත් කර තිබූ අතර ඒ යටතේ අදාළ කරගත යුතු අවශ්‍යතාවයට බන්ධනාගාර | • හානි පාඩු සම්බන්ධයෙන් වූ කටයුතු විධිමත්ව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා නිලධාරියෙක් අනුයුක්ත කර දෙන ලෙස දැනුම් දී ඇත.<br>• කඩිනමින් හානි පාඩු | කාර්යසාධන වාර්තාව තුළ නිවැරදි තොරතුරු වාර්තා කළ යුතුය |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව අනනුකූලව කටයුතු කරන අවස්ථාවන් 06 ක් සඳහා අනුකූලව කටයුතු කරන බව සාවද්‍ය ලෙස වාර්ෂික කාර්යසාධන වාර්තාවේ වාර්තා කර තිබුණි. | ලේඛනය යාවත්කාලීනව සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි.<br><br>• මු.රෙ 396 (ඇ) අනුව එම චෙක්පත සඳහා හිලව් චෙක්පතක් නිකුත් කර ඇති අතර මේ වන විට එම චෙක්පත නිශ්කාෂණය වී ඇත.<br><br>• මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබා දී ඇත.<br><br>• තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී අදාළ කාර්යය නිම වූ වහාම එය පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.<br><br>විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට උපදෙස් දී ඇත. | |

## 3.5. ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව 2021 වර්ෂයට අදාළව අවම වශයෙන් වසර 3ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්) අධ්‍යක්ෂක (ඉංජිනේරු) හා අධ්‍යක්ෂක (සැලසුම්) වෙත උපදෙස් දී ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.6. වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහර හා වැලිකඩ බන්ධනාගාරවල උපකරණ ගබඩාවන් හී හා දුම්බර බන්ධනාගාර රෝහලේ ඖෂධ ගබඩාවන් හී භෞතික පරීක්ෂාවේදී රු.273,051ක් වටිනා තොග අයිතම 12ක ඌනතාවයක්ද රු.105,786ක් වටිනා තොග අයිතම 18ක අතිරික්තයක්ද පැවතුණි. | ආයතනය තුළ සුළු ප්‍රමාණයේ කිරුම් මිනුම් සඳහා තාරාදියක් නොමැති බැවින් යම් යම් අතපසුවීම් සිදු වීම මත මෙකී ඌනතා සිදුව ඇත. එසේම තීන්ත නිකුත් කිරීමේදී ඊට අනුරූපිව තොග පොත යාවත්කාලීන කිරීම අතපසු වීමෙන් මෙම ඌනතාවය පෙන්නුම් කර ඇත. ද්‍රව්‍ය නිකුත් කිරීමේදී කිලෝවට අඩු ප්‍රමාණයන් නිකුත් නොකරන අවස්ථා පැවතීම නිසා එලෙස සුළු ප්‍රමාණයන් දීර්ඝ කාලයක් තිස්සේ එකතු වීමෙන් මෙම අතිරික්තය සිදු වී ඇති බව පෙන්වා දෙමි. | තොග සම්බන්ධයෙන් ඌනතා හා විෂමතා කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.7. පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වසර 10කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 100ක් ඇතුළු සිද්ධීන් 103කට අදාළ අලාභය රු.9,331,078ක්ද, වසර 05 සිට 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 52ක් ඇතුළු සිද්ධීන් 54කට අදාළ අලාභය රු.38,191,911ක්ද, 2021 වර්ෂයේ වූ වාහන අනතුරු 22ක් ඇතුළුව වර්ෂ 05කට වඩා අඩු කාලයක සිට පැවත එන වාහන අනතුරු 94ක් ඇතුළුව සිද්ධීන් 118ක් සම්බන්ධ අලාභය රු.12,130,450 ක්ද, සම්බන්ධයෙන් මුදල් | අදාළ සිද්ධීන් වලින් බහුතරයක අලාභය රක්ෂණ සමාගම් වෙතින් අයකර ගෙන ඇති බව නිරීක්ෂණය කොට ඇති අතර එසේම පාඩු පියවා ගැනීමට කටයුතු කර ඇති සිද්ධීන් පොත් වලින් කපා හැරීමට පත් කොට ඇති කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරමි. | වාහන අනතුරු ඇතුළු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හි සඳහන් පරිදි ක්‍රියාකළ යුතුය. |

| | | |
|---|---|---|
| රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | | |
| (ආ) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් **(i)** යටතේ අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා සිද්ධීන් 275ක් අතුරින් 2017 සිට 2021 වර්ෂය අවසානය දක්වා සිදුවූ අලාභ 26ක් දක්වා තිබුණද, අලාභය තක්සේරු කර නොතිබුණි. | 2017 සිට 2021 වර්ෂයේ අවසාන දක්වා සිදුවූ වාහන අනතුරු 26 සඳහා දෙපාර්තමේන්තුව විසින් පත් කර ඇති තක්සේරු කමිටුවට යොමු කර අදාළ තක්සේරු වටිනාකම් කඩිනමින් ලබා ගෙන ඉදිරි කටයුතු කරමි. | වාහන අනතුරු ඇතුළු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හි සඳහන් පරිදි ක්‍රියාකළ යුතුය. |

### 3.8. අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාරවල ආරක්ෂාව මනා ලෙස පවත්වාගෙන යාම සඳහා බන්ධනාගාර පිවිසුම් දොරටුවල පවත්වාගෙන යන පොත්පත් ලේඛන තුළ පැමිණීම් පිටවීම්වලට අදාළ සියලු විස්තර නිවැරදිව ඇතුළත්කර පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව බන්ධනාගාර රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්ගේ පැමිණීම පිටවීම ද විධිමත්ව එම පොත්පත් හා ලේඛනවල සටහන් කෙරේ. වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොතේ සඳහන් පැමිණීම පිටවීම තොරතුරු පදනම් කරගෙන වෛද්‍ය නිලධාරීන්ට වැටුප් හා දීමනා ගෙවීම් සිදු කිරීමේ දී බන්ධනාගාර පොත්වලට අනුව වෛද්‍ය නිලධාරීන් සේවයට වාර්තා නොකළ කාලයන් ද සේවයට වාර්තා කළ කාලය සේ සලකා ගෙවීම් කර තිබුණි. විගණනය විසින් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේ දී 2021 ඔක්තෝම්බර් මාසය තුළ දුම්බර බන්ධනාගාරයේ හා පල්ලෙකැලේ එළිමහන් සිරකඳවුරට අයත් රෝහල්වල සේවය කරන ශ්‍රේණිගත වෛද්‍යවරුන් තිදෙනෙකු හා ලියාපදිංචි වෛද්‍යවරුන් හත්දෙනෙකු සඳහා රු.2,013,263 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i.) | ඔක්තෝම්බර් මාසයේ සතියේ වැඩ කරන දින 19 තුළ මුළු මිනිස් පැය 1140ක් සේවය කල යුතු වුවද සේවය කර තිබුනේ මිනිස් පැය 229යි මිනිත්තු 05ක් පමණි. මෙම කාලපරිච්ඡේදය තුල නිවාඩු ලබා නොගෙන සේවයට වාර්තා නොකර සිටි මිනිස් දින ගණන 85 ක් විය. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003/02/14 දිනැති ලිපියට අනුව වෛද්‍ය නිලධාරීන්ගේ සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීගේ දීමනා සහතික කිරීමේදී එම වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොතට අනුව සහතික කල යුතු බව දන්වා ඇත. ඒ අනුව වෛද්‍ය නිලධාරීන්ගේ පැමිණීම සටහන් වන ලේඛන ලෙස වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොත පිළිගත් ලේඛනයක් වන බැවින් ඒ අනුව සේවයට වාර්තා කර ඇති බවත් පෙන්වා දිය හැක. | නියමිත රාජකාරී කාලය තුළ වෛද්‍යවරුන් සේවයට වාර්තා කළ යුතු අතර එසේ සේවයට වාර්තා නොකරන්නේ නම් ඔවුන් මෙම කාලය සඳහා නිවාඩු ලබාගත යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii.) | සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හීදී රාජකාරියට වාර්තා කල මිනිස් දින 32 තුල මිනිස් පැය 192ක කාලයක් සේවය කල යුතු වුවද සේවය කර තිබුනේ මිනිස් පැය 82යි මිනිත්තු 30ක් පමණි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003/02/14 දිනැති ලිපියට අනුව වෛද්‍ය නිලධාරීන්ගේ සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීගේ දීමනා සහතික කිරීමේදී එම වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොතට අනුව සහතික කල යුතු බව දන්වා ඇත. ඒ අනුව වෛද්‍ය නිලධාරීන්ගේ පැමිණීම සටහන් වන ලේඛන ලෙස වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොත පිළිගත් ලේඛනයක් වන බැවින් ඒ අනුව සේවයට වාර්තා කර ඇති බවත් පෙන්වා දිය හැක. | සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හීදී සේවයට වාර්තා කර එදිනට නිවාඩු දින වැටුප් ලබා ගන්නේ නම් නියමිත කාලය තුළ සේවය කළ යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii.) | මෙම කාලපරිච්ඡේදය තුල නිත්‍ය රාජකාරී වේලාවෙන් පරිභාහිරව රාජකාරියේ නිරත නොවී ඒ සඳහා රු.622,061 ක් අතිකාල දීමනා ලබාගෙන තිබුණි. | වෛද්‍යවරුන් සඳහා ගෙවනු ලබන්නේ හදිසි ඇමතුම් රාජකාරී කාලය සඳහා වන දීමනාවක් වන අතර ඒ අතිකාල දීමනාවක් නොවන බවත් ඒ අනුව එක් එක් වෛද්‍යවරුන්ගේ හදිසි ඇමතුම් දිනයන් රාජකාරී දින පොතේ සඳහන් කර ඇති අතර එහි දක්වා ඇති දිනයන් සඳහා පමණක් අදාළ දිමනා ඉල්ලුම් කර ඇත. | නිත්‍ය රාජකාරී වේලාවෙන් පරිභාහිරව අතිකාල දීමනා ලබාගන්නා විට එම කාලය තුළ සත්‍යවශයෙන්ම රාජකාරියේ නිරත විය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.9. කළමණාකරන දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැලිකඩ බන්ධනාගාරයේ දැවිතෙල් ගබඩා ටැංකියේ පවතින ලීටර් ප්‍රමාණය මැන ගැනීමට විධිමත් ක්‍රමවේදයක් නොතිබුණි. | ඉන්ධන ගබඩා ටැංකියේ ධාරිතාවය අවශ්‍ය වූ විට මැන ගැනීම සඳහා ක්‍රමවේදයක් මේ දක්වා තිබී නොමැත. නමුත් මේ වන විට ටැංකියේ ධාරිතාවය මැන ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලෙසට බන්ධනාගාර අධ්‍යක්ෂක (ඉංජිනේරු) සහ වැලිකඩ බන්ධනාගාරයේ වාෂ්ප බොයිලේරු වෘත්තීය උපදේශකවරයා වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 715 ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත විවිධ ආයතන වෙතින් පවරා ගෙන තිබුණු වාහන 56ක් සඳහා ලියාපදිංචි සහතිකය (CR) බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමින් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත විවිධ ආයතන වෙතින් පවරා ගෙන තිබුණු වාහන 87න් වාහන 31ක ලියාපදිංචි සහතික මේ වන විට ලබා ගෙන ඇති අතර ඉතිරි ඒවා පවරා ගැනීමට කටයුතු කරනු ලබයි | ඉතිරි වාහන 56 සඳහා ද ලියාපදිංචි සහතිකය බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2021දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු සංඛ්‍යාව 7,872ක් වූ අතර එදිනට තත්‍ය සේවක සංඛ්‍යාව 6,301ක් විය. ඒ අනුව සමස්ථ කාර්යය මණ්ඩලයේ 1,571ක පුරප්පාඩු පැවතුණි. | | |

| | | | |
|---|---|---|---|
| (i.) | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අතිරේක බන්ධනාගාර ජනරාල් තනතුරේ පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුගතව කටයුතු නොකර වැඩ ආවරණය සඳහා ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර අධිකාරීවරයෙකු පත් කර තිබුණි. | ජනාධිපතිවරණය, මහමැතිවරණය පැවැත්වීමත් කොවිඩ් වසංගත තත්ත්වයත් හේතුවෙන් නිසි කාල සීමාවේදී බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුගතව කටයුතු කළ යුතුය. |
| (ii.) | බන්ධනාගාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I), සහකාර බන්ධනාගාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II,III) පුරප්පාඩු වී ඇති තනතුරු 02ක සම්පූර්ණ කිරීමට 2021 දෙසැම්බර් 31 දින තෙක් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | • මෙම තනතුරු දෙක සම්පූර්ණ කිරීමට බන්ධනාගාර මූලස්ථානය මහින් අංක D1/70/2001-1 හා 2020.12.03 දිනැති ලිපිය මහින් පුරප්පාඩු සම්බන්ධව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්තාපන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇත. | ප්‍රමාණවත් පියවර ගෙන අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |
| (iii.) | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ තනතුරු සඳහා 2021 ජනවාරි 01 දින සිට මේ දක්වා පූර්ණකාලීන රාජකාරි ඉටුකිරීම සඳහා වැඩ බලන අධ්‍යක්ෂකවරයෙකු පත් කර තිබුණද, ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය 13(3) වගන්තියට අනුව අදාළ තනතුරුවලට පූර්ණකාලීනව නිලධාරීන් පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අංක D1/70/2013 හා 2020.09.17 දිනැති ලිපිය මගින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කොට ඇත. මෙමගින් වැඩ බැලීම සඳහා නිලධාරී මහතා එකඟ බැවින් ඔහු සේවයේ යෙදවීමට ඉල්ලීම් කර ඇත. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13(3) වගන්තියට අනුව කටයුතු කළ යුතුය. |
| (iv.) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව කාර්යය පරිපාටික රීති පළමු වන කාණ්ඩයේ xvii වැනි ඡේදයෙන් 184 වගන්තිය ප්‍රකාර අභ්‍යන්තර බඳවා ගැනීම් තුල අනුමත කාර්යය මණ්ඩලයට ලබා දිය යුතු උසස්වීම් නියමිත දින වල ලබා දීමට කටයුතු නොකිරීම නිසා බන්ධනාගාර අධිකාරී (විශේෂ ශ්‍රේණිය) සිට ප්‍රධාන ජේලර් දක්වා තනතුරු වල පුරප්පාඩු 47ක් පැවතුණි. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශය මහින් සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව කාර්යය පරිපාටික රීති පළමු වන කාණ්ඩයේ xvii වැනි ඡේදයෙන් 184 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v.) | බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් පාලනය වන දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි වැඩ බිම්, කර්මාන්ත සහ ඉදිකිරීම් වලට සෘජුවම සම්බන්ධවන තනතුරු වල පවතින පුරප්පාඩු 66ක් හේතුවෙන් ඉදිකිරීම්, කර්මාන්ත, වැඩබිම් වල කාර්යක්ෂමතාවය, ව්‍යාපෘතිවල ඵලදායීත්වය හා ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතුණි. | කර්මාන්ත වැඩ මූලික පුරප්පාඩුව සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණ සිදු කිරීමට ප්‍රායෝගිකව නොහැකි අතර අවසානයට එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත්තේ 2020.12.18 දින වේ. කර්මාන්ත පරිපාලන තනතුරේ පුරප්පාඩු 16 සම්පූර්ණ කර ඇත. දෙවන පෙළ වෘත්තීය උපදේශක නිලධාරීන් බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවා ඇත. | අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |
| (vi.) | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩල තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ ( ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය II,III) තනතුරු සඳහා 2013 වර්ෂයේ සිට නිලධාරීන් පත්කර නොතිබුණි. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් 2014.08.01 දින අංක ප/2/9/3/1-2014 දරන ලිපිය මගින් නිලධාරියකු ලබා දිය හැකි බව දන්වා ඇති නමුත් මේ වන තෙක් නිලධාරියෙක් පත් කර නොමැත. | අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |
| (vii.) | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩල තුළ උපදේශන නිලධාරී තනතුරු 07ක් අනුමත කර තිබූ අතර මෙම තනතුරු 07 සම්පූර්ණ කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ගැනීමට කටයුතු නොකිරීම තුළ දීර්ඝ කාලයක සිට මෙම තනතුරේ පුරප්පාඩු පැවතුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපි අංක PSC/ES.T/06-01/05(ii)/09/2021 හා 2022.01.05 දිනැති ලිපියෙන් නව බඳවා ගැනීම්පටිපාටි කෙටුම්පතක් සකස් කර අනුමැතියට එවන මෙන් දන්වා එවා ඇත. | අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |
| (viii.) | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් වරදවල් සම්බන්ධව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විනය කාර්යය පරිපාටි 874ක් පැවති අතර, ඉන් විනය කාර්යය පරිපාටි 352ක් සම්බන්ධයෙන් මූලික විමර්ශණ කටයුතු හෝ ආරම්භ කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ සියළුම අයතනයන් හී මූලික විමර්ෂණයන් හි වර්ථමාන තත්ත්වය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව සොයා බැලීම සඳහා විස්තර වර්තාවක් එවන ලෙස සියලුම ආයතන අධිකාරී වෙත දැනුම් දී ඇත. | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් වරදවල් සම්බන්ධව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විනය කාර්යය පරිපාටි සම්බන්ධයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම, විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම, අවසන් කිරීම හා විනය නියෝග නිකුත් කිරීම අප්‍රමාදව සිදු කළ යුතුය. |